# ශික්ෂණ රෝහල, පේරාදෙණිය.

## ටෙන්ඩර්පත් ලියවිලි

## වායු සමීකරණ යන්ත්‍ර නඩත්තු සේවා සහ අළුත්වැඩියා කටයුතු - 2026/2027

- ටෙන්ඩර් අයදුම්පත
- ටෙන්ඩර් කොන්දේසි හා සේවා කොන්දේසි

❖ (අනු පිටපත)

ප්‍රාදේශිය ප්‍රසම්පාදන මණ්ඩලය,
ශික්ෂණ රෝහල,
පේරාදෙණිය.

දුරකථන අංකය - 081 2388001

ෆැක්ස් අංකය - 081 2388371

## මහ රෝහල ශික්ෂණ පේරාදෙණිය

## කුඩා පරිමාණයේ ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර (කවුළු මාදිලියේ) නඩත්තු හා සේවා කිරීම

### 01.සුදුසුකම්

ඉදිකිරීම් සංවර්ධන ආයතනයේ වලංගු ලියාපදිංචිය (EM-4) හා ලියාපදිංචියට ශීතකරණ හා වායු සමීකරණ සේවය ඇතුලත්විය යුතුය (CIDA EM-4 Mechanical Ventilation and Air Conditioning) (MVAC)

- ❖ (සහතික පිටපත් අමුණා එවිය යුතුය)

රාජ්‍ය හෝ වෙනත් පිළිගත් ආයතනයක වසර 02 ක සේවා පළපුරුද්දක් තිබීම (රජයේ රෝහල් වායු සමීකරණ පද්ධති නඩත්තු සේවයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සැලකේ)

- වායු සමීකරණ යන්ත්‍ර සේවා හා නඩත්තු කටයුතු සිදු කරන සේවකයින් ඒ සඳහා සුදුසුකම් හා පළපුරුදු ඇති සේවකයින් යෙදවිය යුතුය (අවශ්‍ය තාක්ෂණික පළපුරුද්ද තිබිය යුතුය.)
- වංචනික ලියවිලි ඉදිරිපත් කර හෝ වෙනත් ක්‍රියාවක් නිසා අසාදු ලේඛන ගතකර ඇති කොන්ත්‍රාත් කරුවන්ට මේ සඳහා ලංසු ඉදිරිපත් කළ නොහැක.

➢ <u>පූර්ව ප්‍රසම්පාදන රැස්වීම 2026.09.25 දින පෙ.ව. 10.30 ට පේරාදෙණිය මහ රෝහලේ සාකච්ඡා කාරයේදී පැවැත්වේ</u>

### 02.සිදු කළ යුතු සේවාවන් -

1. පේරාදෙණිය මහ රෝහලට අයත් සියළුම ගොඩනැඟිලිවල (වාට්ටු/ඒකක/ශල්‍යාගාර /දැඩි සත්කාර ඒකක/කාර්යාලඇතුළු) රෝහලේ ඇති කුඩා පරිමාණයේ කවුළු හා බෙදුම් මාදිලියේ වායු සමීකරණ යන්ත්‍රවල සේවා හා නඩත්තු කිරීම,
2. සේවා අවශ්‍යතාවයන්වලදී අවශ්‍ය ගෑස් කිරීම / රිමෝට් කොන්ට්‍රොල් සඳහා බැටරි යෙදීම
3. වායු සමීකරණ යන්ත්‍ර මාස දෙකකට (මාස 02) වරක් සේවා කිරීම්කල යුතුවේ . අධි පීඩන සේවා වාර 02 ක් සහ සාමාන්‍ය වාර 04 ක් සිදුකල යුතු වේ. හදිසි සේවා අවශ්‍යතාවන්හිදී කඩිනමින් කාර්යය ඉටුකල යුතු වේ.
4. වායු සමීකරණ යන්ත්‍ර සියළු විස්තර අඩංගු කාඩ්පතක් පවත්වාගෙන යා යුතු අතර, සේවාවන් හා නඩත්තු ඉටු කල වහාම එම කාඩ් පතෙහි සඳහන් කර අදාල ඒකක භාර නිලධාරිගෙන් අත්සන් ලබා ගත යුතු අතර ඒම කාඩ්පත අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ/රෝහල් ලේකම් හෝ බලය පවරනු ලබන නිලධාරියෙකු වෙත ඉදිරිපත් කර අත්සන් ලබාගත යුතුවේ.
5. ශල්‍යාගාරයේ අවශ්‍යතාවය පරිදි මධ්‍යම වායු සමීකරණ පද්ධතිය ක්‍රියාත්මක කරවීම කල යුතුවේ
6. සේවා හා නඩත්තු කටයුතු නිසි වේලාවට සිදුකර සියලුම යන්ත්‍ර මනා ක්‍රියාකාරී තත්වයෙන් පවත්වාගෙන යා යුතුය.
7. අලුත්වැඩියාවන් සිදු කිරීමේදී අදාල වායු සමීකරණ යන්ත්‍ර වර්ගයෙන් නියම අමතර කොටස් (original Parts) සපයා සවි කළ යුතුය.
8. මෙම ගිවිසුමට අදාල නොවන වායු සමීකරණවල දෝෂ ඇත්නම් ඒවා සඳහා යන වියදම් වාර්තාවක් රෝහල් අධ්‍යක්ෂතුමා වෙත ලිඛිතව භාරදිය යුතුවේ.

**03.<u>ප්‍රසම්පාදන ගාස්තු</u>.**

ප්‍රසම්පාදන අයදුම්පත් ගාස්තු සඳහා රු2,500.00 ආපසු නොගෙවන මුදලක් මහ රෝහල ශික්ෂණ පේරාදෙණිය අධ්‍යක්ෂ වෙත ගෙවා ලබා ගත් කුවිතාන්සියක් ටෙන්ඩර්පත් සමග ඉදිරිපත් කළ යුතුය.

**<u>04. ටෙන්ඩර්පත් ලබාගැනීමට අවශ්‍ය සුදුසුකම්</u>**

4.1 ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.

4.2 රෝහලක/රාජ්‍ය ආයතනයක/පිළිගත් ආයතනයක ඉහත සඳහන් විදුලි නඩත්තු කටයුතු සාර්ථකව ඉටු කළ බවට පළපුරුදු සහතිකය හා /හෝ පිළිගත් පුද්ගලික ආයතනයක වසර 02 ක හෝ ඊට වැඩි කාලයක් වායු සමීකරණ යන්ත්‍ර නඩත්තු හා සේවා කටයුතු සාර්ථකව ඉටු කිරීම සම්බන්ධයෙන් පළපුරුද්දක් තිබීම.

4.3 ඉදිකිරීම් සංවර්ධන ආයතනයේ වලංගු ලියාපදිංචිය (EM-4) හා ලියාපදිංචියට ශීතකරණ හා වායු සමීකරණ සේවය ඇතුලත්විය යුතුය (CIDA EM-4 Mechanical Ventilation and Air Conditioning (MVAC)

**05) ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීම.**

5.1 සම්පූර්ණ කරන ලද ලංසු පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුය .එහි මුල් පිටපත හා අනුපිටපත ලෙස වෙන වෙනම කවර දෙකක බහා, ආරක්ෂිත මුද්‍රා තැබූ එක් කවරයක ඇතුලත්කළ යුතු අතර එම කවරයේ ඉහල කෙලවරේ " කුඩා පරිමාණයේ වායු සමීකරණ යන්ත්‍ර නඩත්තු හා සේවා කටයුතු-2026/2027" යනුවෙන් සඳහන් කර ඉදිරිපත් කළ යුතුය. කොන්ත්‍රාත් ආයතනයේ නම හා ලිපිනය පැහැදිලිව ලියුම් කවරයේ දැක්විය යුතුය. ටෙන්ඩර් පත්‍රය සකස් කිරීම හා භාරදීම සම්බන්ධ සියලුම වියදම් ටෙන්ඩර්කරු විසින් දැරිය යුතු අතර ඒ පිළිබඳව පේරදෙණිය ශික්‍ෂණ රෝහලේ අධ්‍යක්ෂකගේ කිසිදු වගකීමක් හෝ බැඳීමක් නැත.

5.2 ඉහත දක්වා ඇති පරිදි මුද්‍රා තැබූ ටෙන්ඩර්පත් 2026.10.07 දින පෙ.ව.10.30 ට පෙර ලැබෙන සේ සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,ශික්‍ෂණ රෝහල, පේරාදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ රෝහලේ ගණකාධිකාරී කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනැවිත් බහාලීම හෝ කළ හැකි අතර ටෙන්ඩර් භාරගැනීම අවසන්වූ විගස, ටෙන්ඩර් විවෘත කිරීමේ කමිටුව ඉදිරියේ විවෘත කරනු ලැබේ.

5.1 ටෙන්ඩර් පෝරමය සම්පූර්ණ කිරීමේදී, එහි වෙන්කර ඇති කොටස ප්‍රමාණවත් නොවේ නම් ඊට අදාල විස්තර අමතර ලියවිල්ලක් ලෙස ඉදිරිපත් කල හැක.එසේ ඉදිරිපත් කරන සියලුම අමතර ලියවිලිවල කොන්ත්‍රාත්කරුගේ අත්සන යොදා නිල මුද්‍රාව තැබිය යුතුය.

5.2 ලංසු ලේඛණ භාර ගන්නා අවසන් වේලාවෙන් පසු ලැබෙන සියලුම ලංසු කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.3 ලංසු භාර ගන්නා අවසන් වේලාව පසු වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. කොන්ත්‍රාත් කරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැක.

5.4 ලංසු විවෘත කිරීමට පත්කල කමිටුවක් විසින් ලංසු විවෘත කරනු ලබන, අතර ඒ ඒ කොන්ත්‍රාත් ආයතනයන්හි මිල ගණන් හා එක් එක් කොන්ත්‍රාත් කරුවන්ගේ නම හා ලිපිනයන් හා ලංසු ඇපකර එවා ඇති නැති බව ප්‍රකාශයට පත් කරනු ලැබේ. තාක්ෂණික තොරතුරු හා අනෙක් විස්තර හෙලිදරව් කරනු නොලැබේ.

**06.** **ලංසු සුරක්ෂණය(රු.120,000.00)**

මහ රෝහල වෙත ගෙවා ලබා ගත් රිසිට්පතක් හෝ රජයේ අනුමත බැංකුවකින් දින 90 වලංගුවන ‘‘ අධ්‍යක්ෂ මහ රෝහල පේරාදෙණිය’’ නමින් නිකුත්කල ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කල යුතුය . සුරක්ෂණය නිදහස් කරනුයේ සියලුම ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමෙන් පසුවය.

**07.කාර්ය සාධන ඇපකරය.**

වාර්ෂික කොන්ත්‍රාත් වටිනාකමින් 10% ක මුදලක් කාර්ය සාධන ඇපකරය වශයෙන් රජයේ අනුමත බැංකුවකින් අදාල ගිවිසුම එළඹීමට පෙර රෝහල් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

**08.** **නඩත්තු සේවා කොන්දේසි -**

1. උප කොන්ත්‍රාත් ලබා නොදිය යුතුයි.

2. **වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියාව පිළිබඳ ප්‍රවිනතාවය ඇති කාර්මික නිලධාරියෙකු සහ කාර්මික සහයකයන් දවසේ පැය 10 ආවරණය වන පරිදි (පෙ.ව. 7.00 සිට ප.ව. 5.00 දක්වා) සේවා මුර ක්‍රමයකට** දිවා කාලයේ අඛණ්ඩ සේවාවක් සිදුකල යුතුවේ. එක් සේවා මුරයක් සඳහා අවම වශයෙන් කාර්මිකයෙකු හා සහායකයෙකු සේවයේ යෙදවිය යුතු අතර කාර්ය මණ්ඩලය යෙදවීමේදී සේවාවේ අවශ්‍යතාවය මත ඌණතාවයකින් තොරව පවත්වාගෙන යා යුතුවේ. එම සේවකයන් කම්කරු ආඥාපනතේ විධිවිධානවලට එකඟව සේවයේ යෙදවිය යුතුය.

3 හදිසි සේවා කැඳවීමකදී පැය 06 ඇතුලත වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියාව පිළිබඳ ප්‍රවීනතාවය ඇති නිලධාරින් රෝහල වෙත වාර්තාකල යුතුය.

4 කොන්ත්‍රාත්තුව පැවරීමෙන් පසු සේවාව සඳහා අනුමත කරන සේවක සංඛ්‍යාව ඌණතාවයකින් තොරව පවත්වා ගැනීම කොන්ත්‍රාත්කරුගේ වගකීම වේ. සේවකයින්ගේ ඉවත් වීමක් හෝ සේවකයින් අළුතින් යෙදවීමක් සිදුවූ වහාම ඒ බව රෝහල් අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතුය.

5 සේවයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් පැමිණීමේ ලේඛණයක් පවත්වාගත යුතු අතර, එම ලේඛණය දිනපතා රෝහල් අධ්‍යක්ෂ වෙත හෝ රෝහල් අධ්‍යක්ෂ විසින් බලය පවරන නිලධාරියකුගේ අධීක්ෂණය සඳහා ඉදිරිපත් කල යුතුය.

6 සේවයේ යෙදවීම අදහස් කරන කාර්මිකයින් ගණන හා ඔවුන්ගේ වෘත්තීය සුදුසුකම් ඇතුළු සියළු විස්තර ටෙන්ඩර් පත්‍රිකාවල සටහන් කලයුතුය.ටෙන්ඩර් පත්‍රිකාවේ ඒ සඳහා වෙන්කර ඇති කොටස ප්‍රමාණවත් නොවේ නම් අදාල විස්තර ටෙන්ඩර් පත්‍රිකාව සමඟ ඇමිණිය යුතුය.

7 අදාල කොන්ත්‍රාත් කාලසීමාව තුල රෝහලේ දැනට තිබෙන සියළුම අංශවල හා එම කාලසීමාව තුල අළුතින් ස්ථාපනය කරන අංශවල ඇති වායු සමීකරණ යන්ත්‍රවලින් ඔබ වෙත පවරනු ලබන සියළු වායු සමීකරණ යන්ත්‍ර නඩත්තු හා සේවාවන් සාර්ථකව ඉටුකල යුතුය.

8 ආයතනය තුල සේවයේ යෙදී සිටින අවස්ථාවලදී, කොන්ත්‍රාත්කරු හා ඔහු විසින් සේවයේ යොදවන කාර්මික/සහායක යන සියළුදෙනා, හදුනා ගැනීම සඳහා සුදුසු,

සම්පූර්ණ නිල ඇඳුමක් හා කොන්ත්‍රාත්කරු විසින් සකස්කරගත් සේවා හැඳුනුම්පතක් පැළඳ සිටීම අනිවාර්ය වේ.

9. සේවා කඩ කිරීම,හදිසි තත්වයන් යටතේ නොපමාව ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් අසතුටුදායක සේවා තත්වයන් පිළිබඳව වාර්තා වන එක් අවස්ථාවකදී රු.5,000.00 ක උපරිමයකට යටත්ව දඩ මුදල් අය කිරීමට යටත් වන අතර එම දඩ මුදල එම ආයතනයට ගෙවීමට නියමිත මාසික බිල්පතින් අඩු කිරීමට කටයුතු කරනු ලැබේ.දඩ මුදල අය කිරීම සම්බන්ධයෙන් ඔබ ආයතනයට දැන්වීමට අධ්‍යක්ෂ බැදී නොමැත.

10. ඔබගේ සේවා කටයුතු ඉටු කිරීම පිළිබඳ නිරන්තර පැමිණිලි වාර්තා වුවහොත් ඔබගේ සේවාව තව දුරටත් මෙම ආයතනයට අනවශ්‍ය සේ සළකා ගිවිසුම් අහෝසි කිරීමට රෝහල් අධ්‍යක්ෂ වෙත බලය පැවරී ඇත.

**09. සේවක වැටුප් හා දීමනා**

කොන්ත්‍රාත්කරු විසින් යොදවන කාර්යමණ්ඩලය සඳහා වැටුප් හා දීමනා කම්කරු දෙපාර්තමේන්තුවේ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලව කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතුවේ

**10. කොන්ත්‍රාත්තුව අවසන් කිරිම.**

තෝරාගනු ලබන කොන්ත්‍රාත්කරුගේ වැඩ පිළිබඳව රෝහල් අධ්‍යක්ෂක සෑහීමකට පත් නොවන්නේ නම් අදාල වර්ෂය ඇතුලත ඕනෑම අවස්ථාවක, මාසයක් කල්දීමෙන් පසුව කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ බලය රෝහල් අධ්‍යක්ෂ සතුවේ.

**11. ගෙවීම් සම්බන්ධ කොන්දේසි.**

සතුටුදායක ලෙස නිමකර ඇති කාර්යයන්,විධිමත් පරිදි නිමකර ඇති බව තහවුරුකර ගැනීමෙන් පසු තෝරාගත් මිලගණන් අනුව,කොන්ත්‍රාත්කරු හා රෝහල් අධ්‍යක්ෂ අතර ඇතිකරගත් ගිවිසුම් ප්‍රකාරව මාසිකව ගෙවීම් කරනු ලැබේ. ඉටුකරනු ලබන සේවා වාරයන් ප්‍රමාණය අනුව බිල්පත් ඉදිරිපත් කල යුතු අතර, එම ප්‍රමාණයන් සඳහා පමණක් ගෙවීම් කරනු ලැබේ.

**12. රක්ෂණය**

අවසන් හානි වගකීම් සහතිකය (last defects liability certificate) නිකුත්කිරීමට පෙර එම කොන්ත්‍රාත්කරු නිසා තෙවන පාර්ශවය සඳහා සිදුවන කිසියම් මරණයක් , පුද්ගල අනතුරක් , භෞතික දේපලකට සිදුවන හානියක් හෝ නැතිවීමක් සඳහා රක්ෂණය කිරීම කොන්ත්‍රාත්කරු විසින් සිදුකල යුතුය.

කොන්ත්‍රාත්කරු විසින් ඔහුගේ වත්කම් රක්ෂණය කර එය පවත්වාගෙන යා යුතු අතර කිසියම් කාර්යයක් හේතුවෙන් කොන්ත්‍රාත්කරු යොදවා ඇති සේවකයින්ට සිදුවන මරණ හෝ අනතුරු හෝ හානි සඳහා වියදම් හා වන්දි ගෙවීම් වලින් දෙපාර්තමේන්තුව හා රෝහල් අධ්‍යක්ෂ නිදහස් වේ.

සේවක භාර අරමුදල්,ඇතුළු කිසියම් පාර්ලිමේන්තු පනතකින් හෝ ව්‍යවස්ථානුකූල විධිවිධාන යටතේ කොන්ත්‍රාත්කරුගේ සේවකයින් කරනු ලබන හිමිකම් සඳහා වන්දි ගෙවීම් වලින් රෝහල් අධ්‍යක්ෂ නිදහස් වේ.

**13. මිළ ගණන් ඉදිරිපත් කිරීම**

ලංසු ඉදිරිපත් කිරීමේ අයදුම්පත්‍රයේ සඳහන් පරිදි යන්ත්‍ර නඩත්තු හා සේවා කටයුතු වෙනුවෙන් මිළ ගණන් ඉදිරිපත් කල යුතු අතර, යන්ත්‍ර අළුත්වැඩියා කාර්යයන් වෙනුවෙන් **උපලේඛණ අංක 1 සහ උපලේඛණ අංක 2 සඳහන් කාර්යයන් වෙනුවෙන් මිළ ගණන් ඉදිරිපත් කල යුතුවේ**. ලංසු ලේඛණ ඇගයීමේදී ලංසු ලේඛණයේ ඇතුලත් සියුළු කොන්දේසි පිළිබඳව සලකා බලනු ලැබේ.

මෙම ටෙන්ඩරයට අදාල වන වායු සමීකරණ යන්ත්‍ර සේවා හා නඩත්තු කටයුතු පිළිබඳව වැඩි විස්තර දැන ගැනීමට අවශ්‍ය වන්නේ නම් පූර්ව දැනුම් දීමකින් අනතුරුව පහත සඳහන් දුරකථන අංක වලින් විමසිය හැකිය.

දුරකථන අංක - 0812388001 ෆැක්ස් අංකය - 0812388371

අධ්‍යක්ෂ,
ශික්ෂණ රෝහල,
පේරාදෙණිය.

**ලංසු ඉදිරිපත් කිරීමේ අයදුම්පත**

**බෙදුම් මාදිලියේ වායු සමීකරණ යන්ත්‍ර නඩත්තු හා සේවා කටයුතු**

1. ආයතනයේ නම :- ...........................................................................................
2. ලිපිනය :- ...........................................................................................
3. දුරකතන අංකය :- ස්ථාවර :- ...................................... ජංගම :- ..........................

   ෆැක්ස් :- ...................................... විද්‍යුත් තැපැල :- ..........................................
4. ලංසු සුරක්ෂණය

   i.බැංකුව හා ශාඛාව:- .............................................................................

   ii.රෝහල් සරප් වෙත මුදලින් ගෙවා ඇත්නම් රිසිට්පත් අංකය:- ...............................
5. CIDA ලියාපදිංචි අංකය EM-4 Mechanical Ventilation and Conditioning (MVAC) ................................
6. වැට් බදු අංකය :-- ...................................................................
7. පූර්ව ආසන්න වසර 02ක සේවා පළපුරුද්ද ( පළපුරුදු සහතික පිටපත් ඇමිණිය යුතුය )

   ..........................................................................................................

   ..........................................................................................................

   ..........................................................................................................

- **ටෙන්ඩර් ලියකියවිලිවල අංක 02 හි සඳහන් සිදුකල යුතු සේවාවන් සහ අංක 09 හි සඳහන් නඩත්තු සේවා කොන්දේසිවලට අදාලව වායු සමීකරණ යන්ත්‍ර සේවා හා නඩත්තු සඳහා යන වියදම් පහත සඳහන් පරිදි ඉදිරිපත් කරන්න ( පහත සඳහන් යන්ත්‍ර ප්‍රමාණය ඉතා සුළු වශයෙන් වෙනස් විය හැක)**
  - **අළුත්වැඩියා කාර්යයන් වෙනුවෙන් උපලේඛණ අංක 1 හා 2 හි මිළ ගණන් ඉදිරිපත්කල යුතුය**

| අනු අංකය | වායු සමීකරණ යන්ත්‍ර මාදිලිය | එක් යන්ත්‍රයක් එක් වරක් සාමාන්‍ය සේවා කිරීමට මුදල (රු.) | එක් යන්ත්‍රයක් එක් වරක් අධි පීඩන සේවා (High pressure) කිරීම සඳහා මුදල (රු.) |
|---|---|---|---|
| **01** | **9,000 BTU/H** | | |
| **02** | **12,000 BTU/H** | | |
| **03** | **18,000 BTU/H** | | |
| **04** | **24,000 BTU/H** | | |
| **05** | **36,000 BTU/H** | | |
| **06** | **48,000 BTU/H** | | |
| **07** | **60,000 BTU/H** | | |

<table>
<tr><th></th><th>වායු සමීකරණ යන්ත්‍ර මාදිලිය</th><th>එක් යන්ත්‍රයක් වසරකට වාර 4ක් සඳහා(මාස 03කට වරක්) සාමාන්‍ය සේවා කිරීමට මුදල (රු.)</th><th>යන්ත්‍ර ගණන</th><th>යන්ත්‍ර සඳහා මුදල</th><th>එක් යන්ත්‍රයක් වසරකට වාර 02 ක්(මාස 06කට වරක්) අධි පීඩන සේවා(High pressure)කිරීම සඳහා මුදල (රු.)</th><th>යන්ත්‍ර සඳහා මුදල</th></tr>
<tr><td>01</td><td>9,000 BTU/H</td><td></td><td>10</td><td></td><td></td><td></td></tr>
<tr><td>02</td><td>12,000 BTU/H</td><td></td><td>91</td><td></td><td></td><td></td></tr>
<tr><td>03</td><td>18,000 BTU/H</td><td></td><td>40</td><td></td><td></td><td></td></tr>
<tr><td>04</td><td>24,000 BTU/H</td><td></td><td>39</td><td></td><td></td><td></td></tr>
<tr><td>05</td><td>36,000 BTU/H</td><td></td><td>04</td><td></td><td></td><td></td></tr>
<tr><td>06</td><td>48,000 BTU/H</td><td></td><td>02</td><td></td><td></td><td></td></tr>
<tr><td>07</td><td>60,000 BTU/H</td><td></td><td>06</td><td></td><td></td><td></td></tr>
<tr><td colspan="4">මුළු මුදල</td><td></td><td></td><td></td></tr>
<tr><td colspan="4" rowspan="2">යන්ත්‍ර සඳහා වාර්ෂිකව සේවා කිරීමට සම්පූර්ණ මුදල(සාමාන්‍ය හා අධි පීඩන සේවා වාර දෙකම සිදු කිරීම)</td><td colspan="2">වැට් රහිත</td><td>වැට් සහිත</td></tr>
<tr><td colspan="2"></td><td></td></tr>
</table>

දිනය- ............................................ .....................................................

කොන්ත්‍රාත්කරුගේ අත්සන
(නිල මුද්‍රාව)

උපලේඛණ අංක 01

NON INVERTER වර්ගයේ වායු සමීකරණ වායු සමීකරණ යන්ත්‍ර (Spilt type) අළුත්වැඩියා කටයුතු සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම ( එක් යන්ත්‍රයක් බැගින් අළුත්වැඩියා කිරීමට යන මුදල)

| | වැඩ විස්තරය. | 9000 BTU(රු.) | 12000 BTU(රු.) | 18000 BTU(රු.) | 24000 BTU(රු.) | 36000 BTU(රු.) | 48000 BTU(රු.) | 60000 BTU(රු.) | WARRANTY PERIAD |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | COMPRESSOR 1 අළුතෙන් යොදා ගෑස් නැවත පුරවා අළුත්වැඩියා නිසි අයුරින් සිදු කිරීම. | | | | | | | | |
| 2 | COMPRESSOR, COOLER,LINES වල ගෑස් කාන්දු පාස්සා අළුත්වැඩියා කර අධිපීඩන නයිට්‍රජන් වායුව යොදා පරීක්ෂා කර ගෑස් නැවත පුරවා සම්පූර්ණ කිරීම. | | | | | | | | |
| 3 | OUT DOOR FAN MOTER අළුතින් යොදා නිසි ලෙස අළුත්වැඩියා කිරීම | | | | | | | | |
| 4 | OUT DOOR FAN MOTER BEARING යොදා නිසි ලෙස අළුත්වැඩියා කිරීම | | | | | | | | |
| 5 | OUT DOOR FAN MOTER RE WINDING කර නිසි ලෙස අළුත්වැඩියා කිරීම | | | | | | | | |
| 6 | OUT DOOR FAN MOTER CAPACITER යොදා නිසි ලෙස අළුත්වැඩියා කිරීම | | | | | | | | |
| 7 | BLOWER FAN MOTER අළුතින් යොදා නිසි ලෙස අළුත්වැඩියා කිරීම | | | | | | | | |
| 8 | BLOWER FAN MOTER RE WINDING කර නිසි ලෙස අළුත්වැඩියා කිරීම | | | | | | | | |
| 9 | BLOWER MOTER BEARING යොදා නිසි ලෙස අළුත්වැඩියා කිරීම | | | | | | | | |
| 10 | BLOWER MOTER CAPACITER අළුතෙන් යොදා නිසි ලෙස අළුත්වැඩියා කිරීම | | | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 11 | ELECTRONIC CONTROL CIRCUIT අළුත්වැඩියා කිරීම | | | | | | | | |
| 12 | ELECTRONIC CONTROL CIRCUIT අළුතෙන් යොදා අළුත්වැඩියා කිරීම (INDOOR) | | | | | | | | |
| 13 | ELECTRONIC CONTROL CIRCUIT අළුතෙන් යොදා අළුත්වැඩියා කිරීම (OUT DOOR) | | | | | | | | |
| 14 | REMORT CONTROL අළුතෙන් යෙදීම | | | | | | | | |
| 15 | වායු සමීකරණ යන්ත්‍රයක් PUMP DOWN සේවාවක් සිදුකිරීම | | | | | | | | |
| 16 | ස්පිල්ට් වර්ගයේ වායු සමීකරණ යන්ත්‍රයක් ගලවා වෙනත් ස්ථානයක සවි කිරීම (මීටර් 5 ක් ඇතුලත) | | | | | | | | |
| 17 | ස්පිල්ට් වර්ගයේ වායු සමීකරණ යන්ත්‍රයක් ගලවා වෙනත් ස්ථානයක සවි කිරීමේදි (මීටර් 5 කට වඩා වැඩි දුරකින්) වැඩිවන එක් මීටරයක් සඳහා ඇස්තමේන්තු මුදල | | | | | | | | |

දිනය- ............................................ ......................................................

කොන්ත්‍රාත්කරුගේ අත්සන
(නිල මුද්‍රාව)

## උපලේඛණ අංක 02

INVERTER වර්ගයේ වායු සමීකරණ වායු සමීකරණ යන්ත්‍ර (Spilt type) අළුත්වැඩියා කටයුතු සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම ( එක් යන්ත්‍රයක් බැගින් අළුත්වැඩියා කිරීමට යන මුදල)

| | **වැඩ විස්තරය.** | 9000 BTU(රු.) | 12000 BTU(රු.) | 18000 BTU(රු.) | 24000 BTU(රු.) | 36000 BTU(රු.) | 48000 BTU(රු.) | 60000 BTU(රු.) | **WARRANTY PERIAD** |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | COMPRESSOR 1 අළුතෙන් යොදා ගෑස් නැවත පුරවා අළුත්වැඩියා නිසි අයුරින් සිදු කිරීම. | | | | | | | | |
| 2 | COMPRESSOR, COOLER,LINES වල ගෑස් කාන්දු පාස්සා අළුත්වැඩියා කර අධිපීඩන නයිට්‍රජන් වායුව යොදා පරීක්ෂා කර ගෑස් නැවත පුරවා සම්පූර්ණ කිරීම. | | | | | | | | |
| 3 | OUT DOOR FAN MOTER අළුතින් යොදා නිසි ලෙස අළුත්වැඩියා කිරීම | | | | | | | | |
| 4 | OUT DOOR FAN MOTER BEARING යොදා නිසි ලෙස අළුත්වැඩියා කිරීම | | | | | | | | |
| 5 | OUT DOOR FAN MOTER RE WINDING කර නිසි ලෙස අළුත්වැඩියා කිරීම | | | | | | | | |
| 6 | OUT DOOR FAN MOTER CAPACITER යොදා නිසි ලෙස අළුත්වැඩියා කිරීම | | | | | | | | |
| 7 | BLOWER FAN MOTER අළුතින් යොදා නිසි ලෙස අළුත්වැඩියා කිරීම | | | | | | | | |
| 8 | BLOWER FAN MOTER RE WINDING කර නිසි ලෙස අළුත්වැඩියා කිරීම | | | | | | | | |
| 9 | BLOWER MOTER BEARING යොදා නිසි ලෙස අළුත්වැඩියා කිරීම | | | | | | | | |
| 10 | BLOWER MOTER CAPACITER අළුතෙන් යොදා නිසි ලෙස අළුත්වැඩියා කිරීම | | | | | | | | |
| 11 | ELECTRONIC CONTROL CIRCUIT අළුත්වැඩියා කිරීම | | | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 12 | ELECTRONIC CONTROL CIRCUIT අළුතෙන් යොදා අළුත්වැඩියා කිරීම (INDOOR) | | | | | | | | | |
| 13 | ELECTRONIC CONTROL CIRCUIT අළුතෙන් යොදා අළුත්වැඩියා කිරීම (OUT DOOR) | | | | | | | | | |
| 14 | REMORT CONTROL අළුතෙන් යෙදීම | | | | | | | | | |
| 15 | වායු සමීකරණ යන්ත්‍රයක් PUMP DOWN සේවාවක් සිදුකිරීම | | | | | | | | | |
| 16 | ස්පිල්ට් වර්ගයේ වායු සමීකරණ යන්ත්‍රයක් ගලවා වෙනත් ස්ථානයක සවි කිරීම (මීටර් 10 ක් ඇතුලත) | | | | | | | | | |
| 17 | ස්පිල්ට් වර්ගයේ වායු සමීකරණ යන්ත්‍රයක් ගලවා වෙනත් ස්ථානයක සවි කිරීමේදි (මීටර් 5 කට වඩා වැඩි දුරකින්) වැඩිවන එක් මීටරයක් සඳහා ඇස්තමේන්තු මුදල | | | | | | | | | |

දිනය- ..........................................              ....................................................

කොන්ත්‍රාත්කරුගේ අත්සන
(නිල මුද්‍රාව)